# FPA පුවත් සංග්‍රහය

2014 පළමු කලාපය

**SRI LANKA**
**enriching relationships**

VISION2020

www.fpasrilanka.org

**තිරසාර සංවර්ධන ඉලක්ක ජයගනිමු...**

## උතුරේ ජනතාවට නැවතත් අපගේ සේවාවන්...



උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය පී. සත්‍යලිංගම් මහතා වෙත Colposcopy (ගැබ්ගෙල පිළිකා පූර්ව හඳුනාගැනීම සඳහා) යන්ත්‍රයක් බාර දෙමින්.... මෙම අවස්ථාවට ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ගරු සභාපතිනි විශේෂඥ වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මහත්මිය, ගරු භාණ්ඩාගාරික ඉස්මත් ඉසඩින් මහතා, ගරු උප සභාපති නිමල් වීරසේකර මහතා විධායක අධ්‍යක්ෂිකා තුෂාරා රණසිංහ ආගුස් මහත්මිය, නියෝජ්‍ය විධායක අධ්‍යක්ෂ ලසන්ත ගුණරත්න මහතා ඇතුළු පිරිසත් සහභාගි වූහ.

**ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් කිලිනොච්චියේදී පසුගිය මාර්තු 4 වැනිදා විවෘත විය. වසරක පමණ කාලයකින් පසුව නැවතත් උතුරු පළාතේ ජනතාවට සේවා ලබාදීමට මෙමඟින් හැකිවේ.**

මෙම මධ්‍යස්ථානය විවෘත කිරීම උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය පී. සත්‍යලිංගම් මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු වූ අතර මෙම අවස්ථාවට ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ගරු සභාපතිනි වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මහත්මිය සහ සංගමයේ ජාතික මණ්ඩලයේ මහත්ම මහත්මීන් පිරිසක් සහභාගි වූහ. උතුරු පළාතේ ඉතා දුෂ්කර ප්‍රදේශයන් හි ජනතාවට අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා ලබා දීමට සෞඛ්‍ය අමාත්‍යංශය හා එක්ව ඊට සහාය දැක්වීමට මෙම මධ්‍යස්ථානයට ඉදිරියේදී හැකි වනු ඇත.

ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීමට සමගාමීව කිලිනොච්චිය, මුලතිව් සහ පුතුක්කුඩියිරුප්පු යන ප්‍රදේශයන් හි ජීවත්වන යුද්ධ නිසා වැන්දඹු තත්ත්වයට පත් කාන්තාවන් සහ මව්වරුන් 400කට පමණ මාතෘ ආධාරක කට්ටල සහ වියලි ආහාර ද්‍රව්‍ය බෙදා දීමද සිදු විය. ශ්‍රී ලංකා යුධ හමුදාවේ 23 වන පාබල රෙජිමේන්තුව සහ පුතුක්කුඩියිරුප්පු පොලීසිය මෙම කටයුතු සංවිධානය සඳහා සහාය දක්වන ලදි.

තවත් ඡායාරූප කිහිපයක් 6 පිටුවේ

## ලෝක ජනගහනය සහ සංවර්ධනය පිළිබඳ 47 වන සැසි වාරයට සහභාගි වෙමින්...




මෙම අවස්ථාවට ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය පාලිත මහීපාල මහතා, සංඛ්‍යාලේඛන හා සංගණන දෙපාර්තුමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා වාසනා ජයකොඩි මහත්මිය (මැද) ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ අධිවාචන ඒකකයේ අධ්‍යක්ෂිකා මදූෂා දිසානායක මහත්මිය (වමේ) සහභාගී වු අතර සිවිල් සමාජ නියෝජනය කරමින් ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ තරුණ කමිටුවේ ලේකම් දක්ෂිත වික්‍රමරත්න මහතා (දකුණේ) සහභාගී විය.

ඇමරිකාවේ නිව්යෝර්ක් නුවර එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලස්ථානයේදී පසුගිය අප්‍රේල් 07 වැනිදා සිට 11 වැනිදා දක්වා ලෝක ජනගහනය සහ සංවර්ධනය පිළිබඳ 47 වැනි සැසිවාරය පැවැත්විය. මෙම වසරේ සැප්තැම්බර් මාසයේදී පැවැත්වීමට නියමිත '2014 න් පසු ජනගහනය සහ සංවර්ධනය' පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල විශේෂ රැස්වීමට පෙර පැවැත්වූ ලෝක ජනගහනය සහ සංවර්ධනය පිළිබඳ අවසන් සමාලෝචන සැසිය ලෙස මෙය සුවිශේෂතාවක් ගනු ලැබීය. මෙහිදි 1994 කයිරෝහිදී එකඟතාවට පැමිණි අරමුණු පිළිබඳ 20 වසරක සමාලෝචනය කිරීම විශේෂ කරුණකි.

**ජාත්‍යන්තර කාන්තා දිනය 2014**

**ප්‍රබෝධවත් වෙනසක් ඇති කරමු!**

3 පිටුව

## සමාජ අලෙවිකරණ ජාත්‍යන්තර සමුළුවේදී ...




සමාජ අලෙවිකරණය සහ අලෙවි නියෝජිත භාවය පිළිබඳ ජාත්‍යන්තර සෞඛ්‍ය සමුළුව ඉන්දියාවේ කේරල ප්‍රාන්තයේ කුචී නුවරදී පසුගිය වසරේ දෙසැම්බර් මාසයේදී පැවැත්විය. ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ විධායක අධ්‍යක්ෂිකා තුෂාරා ආගුස් මහත්මිය එම සමුළුව ඇමතූ අවස්ථාව. මෙම අවස්ථාවට සමාජ අලෙවිකරණ ඒකකයේ අධ්‍යක්ෂ සුහයිල් ජුනයිඩ් මහතා ද එක් විය.

## සෞඛ්‍ය සම්පන්න පවුලක් තේමාව යටතේ වීඩියෝ සංයුක්ත තැටියක්



"සැලසුම් කළ සෞඛ්‍යසම්පන්න පවුලක්" තේමාව යටතේ සකස්කල වීඩියෝ සංයුක්ත තැටිය ගරු සභාපතිනි ප්‍රාමිලා සේනානායක මහත්මිය විසින් තොරතුරු, තාක්ෂණ සහ අධ්‍යාපන කමිටුවේ ගරු සභාපතිනි වෛද්‍ය එස්තර් අමරසේකර මහත්මිය වෙත බාර දුන් අවස්ථාව.

## පාරිභෝගික භාණ්ඩ ආරක්ෂාව පිළිබඳ වැඩමුළුව



සැලසුම් කළ මාපියභාවය පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනයේ ලන්ඩන් නුවර ප්‍රධාන කාර්යාලයේ පසුගිය වසරේ සංවිධානය කර තිබූ මෙම වැඩමුළුවට ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ගරු සභාපතිනි වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මහත්මිය (වමේ සිට දෙවැන්නා), සමාජ අලෙවිකරණ ඒකකයේ අධ්‍යක්ෂ සුහයිල් ජුනයිඩ් මහතා (දකුණේ සිට දෙවැන්නා) සහභාගී වූහ.

## එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත හමුවූ අවස්ථාව



ලෝක ජනගහන සහ සංවර්ධනය පිළිබඳ 47 වැනි සැසිවාරයට සහභාගි වූ ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ අධිවාචන ඒකකයේ අධ්‍යක්ෂිකා මදූෂා දිසානායක මහත්මිය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත පාලිත කොහොන මහතා හමු වූ අවස්ථාව.

## කුරුණෑගල අලෙවි නියෝජිත හමුව



අලෙවි අධ්‍යක්ෂක සුහයිල් ජුනයිඩ් මහතා සභාව අමතමින්...

# ජාත්‍යන්තර කාන්තා දිනය 2014
# ප්‍රබෝධවත් වෙනසක් ඇතිකරමු!

ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සහ අයිතිවාසිකම් පිළිබඳව ඔබ - අප සෑම කෙනෙකුටම නිසි ලෙස නිවැරදි දැනුමක් - අවබෝධයක් තිබිය යුතුය. ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය අපේ රටේ ජනතාව වෙනුවෙන් පුරෝගාමී මෙහෙවරක් ලෙස මෙම කර්තව්‍යය අරඹමින් ජනතාව දැනුවත් කිරීමේ කාර්ය මෙන්ම සේවා සහ උපදේශනය ලබාදීම වසර 60කට වැඩි කාලයක් පුරා සිදුකරමින් සිටී.

ජාත්‍යන්තර කාන්තා දිනය සමරන මොහොතේ මෙරට නීති, දේශපාලන, කලා, අධ්‍යාපන ආදී ක්ෂේත්‍රයන්හි විද්වත් කීර්තිමත් කාන්තාවන් කිහිපදෙනෙකු හමුවී ''ප්‍රබෝධවත් වෙනසක්'' ඇති කිරීම සඳහා ඔවුන්ගේ අදහස් විමසන ලදි. ඔවුන්ගේ මෙම අදහස් **fpasrilankafacebook** සමාජ ජාලය මගින්ද ඔබට නැරඹිය හැකිය. ඒ අතරින් **ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ශිරාණි තිලකවර්ධන මහත්මියගේ** සහ **ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන් මහත්මියගේ** අදහස් මෙසේ ඉදිරිපත් කරමු.



### ඉතා ඉක්මණින් සියලු ඉහළ මට්ටමේ ස්ථානවල නිසි කාන්තා නියෝජනයක් අවශ්‍යයයි!

**ශිරාණී තිලකවර්ධන**
**ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු**

නීතිය සම්බන්ධව වසර 27ක් දකුණු ආසියානු හා අප්‍රිකානු කලාපය තුළ කටයුතු කිරීමෙන් පසුව මට දැනෙන ආකාරයට ඉතා ඉක්මණින් සියලු ඉහළ මට්ටමේ ස්ථානවල නිසි කාන්තා නියෝජනයක් අවශ්‍යයයි; විශේෂයෙන්ම ආර්ථික බලගැන්වීම ඇතුළත්ව. කොන්කිරීම, ලිංගික අපයෝජනය හෝ වෙනත් ශාරීරිකව, මානසිකව සිදුවන අපයෝජනයක් බලය අවභාවිතයක් ලෙස හඳුන්වන්න පුළුවන්. කිසියම් කොන් කිරීමකින් හෝ බෙදා වෙන්කිරීමකින් තොරව සමාජ පිළිගැනීම සම්ප්‍රදායන් තුළ කාන්තාව ආරක්ෂා විය යුතුය.

මේ සියල්ල විටින් විට වෙනස්වන දේවල්ය. නීතිය ලෝකයේ සෑම කාන්තාවකටම තහවුරු කරන්නේ කාන්තාවකට ලැබිය යුතු දේවල්වල ප්‍රමිතියයි. කාන්තාවන් හා පුරුෂයන් එම ප්‍රමිතියේ පාර්ශ්වකරුවන් ලෙස නිදහස, අයිතීන් හඳුනාගැනීම, තහවුරු කිරීම හා පිළිගැනීම අවශ්‍ය වෙනවා.

එමෙන් වැදගත් දේ වන්නේ සෑම දෙයක්ම ව්‍යවස්ථාවන් න්‍යායාත්මකව සාමාන්‍යාත්මකව තහවුරු කිරීම පමණක් ප්‍රමාණවත් නොවීමය.

මක්නිසාද මෙහි ප්‍රමිතිය අඩුකරන විශාල බාධක රැසක් අපට දකින්න පුළුවන්. තහවුරු විය යුත්තේ කාන්තාවකට ලැබෙන දේ ඵලදායි ලෙස ප්‍රමිතිගතව ලැබීමයි. කළ යුත්තේ මෙම බාධක මඟහරවා ගැනීම සඳහා ක්‍රමෝපායන් හා චර්යාවන් සැකසීමයි.

ඒ තුළින් අපට සහතික කරගැනීමට පුළුවන් කාන්තාවගේ නිදහස හා අයිතිය තහවුරු වී ඇති බව.



### කාන්තාවක් යනු පිරිමින්ට වඩා වෙනස් අවශ්‍යතා හා අයිතීන් සහිත ඒ සඳහා පහසුකම් ලබාදිය යුතු පිරිසක්

**ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්**
**විධායක අධ්‍යක්ෂිකා - කාන්තා අධ්‍යාපන හා පර්යේෂණ මධ්‍යස්ථානය**

ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය යනු පුළුල් හා සාරගර්භ මාතෘකාවක්, ලිංගික අයිතීන්, ප්‍රජනක අයිතීන්වලට පසුව තියෙන වැදගත් මාතෘකාවක්. එය ඇගේ ශරීරය පිළිබඳ දෙයක්. ලිංගික හෝ ප්‍රජනක අයිතීන් වේවා රජය, ප්‍රජාව හෝ ආගම විසින් කාන්තාවන්ගේ ශරීරය පිළිබඳ පාලනය කිරීම් නොකළ යුතුය. ඒ ආකාරයට කටයුතු කළහොත් ලිංගික අයිතීන් කාන්තාවන්ට හිමිවේවි; ප්‍රජනක අයිතීන් හිමිවේවි. සෞඛ්‍ය නියම මාර්ගයක ගමන් කරාවි. මම සිතන්නේ මූලිකවම ප්‍රතිපත්තිමය වශයෙන් අප විසින් ස්ත්‍රියට ඇගේ ශරීර අවයව පිළිබඳ ස්වයං අයිතිය ලබාදිය යුතුයි. එවිට අපට ලිංගික අයිතීන් ගැන කථා කිරීමට හැකිය.

එකිනෙකා නො ගැලපීම හෝ අසමානතාවක් නිසා ඇයට අවශ්‍ය නම් සැමියාගෙන් දික්කසාද වෙන්න එය ඇගේ ලිංගික අයිතියක් වේ. එසේම ඇයට ගබ්සාවක් සිදුකර ගැනීමට අවශ්‍ය නම් එය ඇගේ ශාරීරික අයිතිවාසිකමක්. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය පහසුකම් කාන්තාවන්ට, දරුවන්ට හා පුරුෂයන්ට ආදී ලෙස සැමදෙනාටම හිමි වූ දෙයක්. ඒ අතරම කාන්තාවන්ගේ සෞඛ්‍යයට සුවිශේෂි වූ කාරණා තිබෙනවා. විශේෂයෙන්ම ගර්භණී කාලයේදී හා කිරිදෙන කාලයේදී. වෙනත් කාරණා සමඟ මේ කාරණා ගැටෙනවා. විශේෂයෙන්ම ප්‍රසූත්‍ර නිවාඩු ආදී දේවල්වලදී කාන්තාවක් යනු පිරිමින්ට වඩා වෙනස් අවශ්‍යතා හා අයිතීන් සහිත ඒ සඳහා පහසුකම් ලබාදිය යුතු පිරිසක් බව අප අවබෝධ කරගත යුතුයි.

# කාර්ය මණ්ඩලයේ සේවා ඇගයීම් සම්මාන 2013

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ කාර්ය මණ්ඩලය සඳහා සේවා ඇගයීම් සම්මාන පිරිනැමීම වාර්ෂිකව සිදුකරන අතර 2013 වසර සඳහා එම සම්මාන පිරිනැමීම සිදු වූ අවස්ථාවයි මේ.

## වසර 35ක සේවා කාලය වෙනුවෙන්



වෛද්‍ය ඒකකයේ **ඩී. ජී. මල්ලිකා** මහත්මිය ගරු සභාපතිනි වෛද්‍ය **ප්‍රාමිලා සේනානායක** මහත්මිය අතින් සම්මාන ලබමින් ...

## වසර 25ක සේවා කාලය වෙනුවෙන්





සමාජ අලෙවිකරණ ඒකකයේ සහකාර අධ්‍යක්ෂ **එච්. එස් පතිරණ** මහතා (වමේ ඡායාරූපයේ) සහ ප්‍රවාහන ඒකකයේ **එන්. ජේ. පණ්ඩිතරත්න** මහතා මූල්‍ය කමිටුවේ ගරු සභාපති **ඔලිවර් ප්‍රනාන්දු** මහතා අතින් සම්මාන ලබමින් ...

## වසර 10 ක සේවා කාලය වෙනුවෙන්







වෛද්‍ය ඒකකයේ **එන්. ටී. රවිකුමාර්** මහත්මිය (වමේ ඡායාරූපයේ), ප්‍රවාහන සහ නඩත්තු ඒකකයේ **එස්. ඊ. එම්. සුබසිංහ** මහතා (මැද ඡායාරූපයේ) සහ සමාජ අලෙවිකරණ ඒකකයේ ජ්‍යෙෂ්ඨ අලෙවි විධායක **වයි. පී. එල්. පී. පතිරණ** මහතා (දකුණේ ඡායාරූපයේ) ගරු භාණ්ඩාගාරික **ඉස්මත් ඉසඩීන්** මහතා අතින් සම්මාන ලබමින් ...

## 2012 අලෙවිකරණ විශිෂ්ටයින්



2012 වසරේ විශිෂ්ටතම අලෙවිකරණ නිලධාරියා ලෙස ජ්‍යෙෂ්ඨ අලෙවි විධායක **සමන් ඒකනායක** මහතා ගරු සභාපති තුමිය අතින් සම්මාන ලබාගත් මොහොත.



2012 වසරේ විශිෂ්ටතම අලෙවිකරණ නිළධාරියා දෙවන ස්ථානය සඳහා සහකාර අලෙවි කළමනාකර **තුෂාර බටදූවආරච්චි** මහතා සම්මාන ලබාගත් මොහොත.



2012 වසරේ විශිෂ්ටතම අලෙවිකරණ නිළධාරියා තෙවන ස්ථානය සඳහා අලෙවි විධායක **ලහිරු සමන් කුලසිංහ** මහතා සම්මාන ලබාගත් මොහොත.

# ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් පැවැති වැඩසටහන්

## මඩකලපුව







මඩකලපුව FPA සුවසේවා මධ්‍යස්ථානය ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීම පුවරු රැගත් පා ගමනක් සංවිධානය කරන ලදී. කාන්තාවන් 800ක් පමණ මේ සඳහා සහභාගී වූහ. එම කාන්තාවන්ට සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ අතර කාන්තාවන්, ළමුන් සහ තරුණ පිරිස සඳහා සුවිශේෂ වූ ඉලක්ක පිළිබඳ දැනුවත් කිරීමද සිදුවිය.

## කොග්ගල



කොග්ගල FPA සුවසේවා මධ්‍යස්ථානය මාර්තු 6 වැනිදා දවස පුරා ජගත් කාන්තා දින සැමරුම් වැඩසටහන් කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපයේ ශ්‍රවනාගාරයේදී පවත්වන ලදි. කාන්තාවන් තුන්සියයකට ආසන්න පිරිසක් මෙම අවස්ථාවට එක් වූහ.

## ඩිමෝ ආයතනයේදී දැනුවත් කිරීමේ වැඩසටහනක්




ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ වෛද්‍ය අධ්‍යක්ෂිකා සුමිත්‍රා තිසේරා මහත්මිය ඩිමෝ ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන මෙහෙයවමින්...

## ධනාත්මක කටයුතු කිරීම - කාර්ය මණ්ඩලය සඳහා වැඩමුළුව




**Zion Consulting** ආයතනයේ දේනුකා පෙරේරා මිය සහ පාලන අධ්‍යක්ෂිකා කුසුම් ද සිල්වා මෙනෙවිය වැඩසටහන මෙහෙයවමින්...

# FPA පුවත් සංග්‍රහය

2014 පළමු කලාපය


**ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ තොරතුරු, වෛද්‍ය උපදෙස් හෝ උපදේශන සේවා ඔබ ඉන්නා තැන සිටම ලබාගැනීමට**
**අමතන්න 2 588 488**
**පිවිසෙන්න www.happylife.lk**
**SMS කරන්න 071 6 408 408**


www.fpasrilanka.org

**තිරසාර සංවර්ධන ඉලක්ක ජයගනිමු...**



37/27, බුලර්ස් පටුමග, කොළඹ 07. දුරකථන : 011 2 555 455
ෆැක්ස් : 011 2 55 66 11 ඊ මේල් : fpa@fpasrilanka.org


පළමු පිටුවෙන්

## පුතුක්කුඩියිරුප්පු පොලීසියේ දී පැවැති ද්‍රව්‍ය ආධාර බෙදා දීම




පුතුක්කුඩියිරුප්පු පොලීසියේ දී පැවැති ද්‍රව්‍ය ආධාර බෙදා දීමේ දී ගරු සභාපතිනි විශේෂඥ වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මහත්මිය පිරිස අමතමින්...



ගරු උප සභාපති නිමල් වීරසේකර මහතා මවකට ආධාර කට්ටලයක් ලබා දෙමින්...

## ශාන්ත අන්තෝනි විද්‍යාලයීය ප්‍රදර්ශනයේදී...



මහනුවර ශාන්ත අන්තෝනී විද්‍යාලයේ "**Renision** 2014" අධ්‍යාපනික ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ජංගම ප්‍රදර්ශනයක් පැවැත් වූ අවස්ථාව. නුවර එළිය සුවසේවා මධ්‍යස්ථානයේ කළමණාකාර පී. ජී. එන්. පි. දයාරත්න මහතා පැහැදිලි කිරීමක් සිදු කරමින්...

## මුලතිව්හිදී ද්‍රව්‍ය ආධාර බෙදා දීම



ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්. එන්. වී. පී. රාජපක්ෂ මහතා, මුලතිව් බලසේනාධිපති කර්නල් මර්ලින් ප්‍රනාන්දු මහතා, 23 වන පාබල රෙජිමේන්තුවේ මේජර් මිල්රෝයි ඩයස් මහතා ඇතුළු පිරිස මෙම අවස්ථාවට සහභාගී වෙමින්...

## ඡායාරූපකරණය පිළිබඳ වැඩමුළුවේදී ...





ප්‍රවීණ ඡායාරූප ශිල්පි පණ්ඩුක ද සිල්වා මහතා සහ චන්ද්‍රසේන පෙරේරා මහතාගේ සහභාගීත්වයෙන් කාර්යය මණ්ඩලය සඳහා පැවැත්වූ ඡයාරූපකරණය පිළිබඳ වැඩමුළුවෙන් ...


VISION2020
Sexual and reproductive health rights for all

සංස්කරණය : ආනන්ද බෝධිනායක - ananda@fpasrilaka.org
සම්බන්ධීකරණය : අධිවාචන (Advocacy) ඒකකය